# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 14,567 — 1965 නොවැම්බර් 24 වැනි බදාදා — 1965.11.24

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි.)


# III වැනි කොටස—ඉඩම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාගයකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කරගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

38 වෙනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

1965 අංක 355 දරණ ආඥාව

යොමු අංකය : පේ 63/64 ඩබ්ලිව්. 32/එල්ඩී 87.

1964 අංක 28 දරණ ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වෙනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති චාර්ල්ස් පර්සිවල් ද සිල්වා වන මම, පහත සඳහන් උපලේඛනයේ I වෙනි තීරයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත් එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියාට, එම උපලේඛනයේ II වෙනි තීරයේ අනුරූප සටහනේ දක්වෙන නියමිත ඉඩම් ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

සී. පී. ද සිල්වා,
ඉඩම්, වාරිමාර්ග හා විදුලිබල ඇමති

කොළඹ, 1965 නොවැම්බර් මස 23 වෙනි දිනදිය.

### උපලේඛනය

| I<br>ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා | | II<br>ඉඩමේ විස්තරය |
|---|---|---|
| මහනුවර දිස්ත්‍රික්කයේ උප දිසාපති | ... | පහත සඳහන් අන්දමට මායිම් වී ඇති මහනුවර දිස්ත්‍රික්කයේ, අඹගමුව කෝරළේ, අඹගමුව කෝරළේ ප්‍රාදේශීය ආදායම් නිලධාරි කොට්ඨාශයේ, මස්කෙළිය ග්‍රාම සේවක වසමේ, මස්කෙළිය ගමේ පිහිටි ගහේවත්ත වත්ත සහ රිකාර්ටන් වත්ත යන ඉඩම් වලින් ප්‍රමාණයෙන් අක්කර 62, රූඩ් 2, පර්. 14 ක් පමණ වන ඉඩම් කොටස් දෙක :— |

1. රිකාර්ටන් වත්ත— ප්‍රමාණය අක්. 51, රූඩ් 1, පර්. 00 පමණ—

| | | |
|---|---|---|
| උතුරට | — | රිකාර්ටන් වත්තේ ඉතිරි කොටස සහ මස්කෙළිය ඔය |
| නැගෙනහිරට | — | මස්කෙළිය ඔය |
| දකුණට | — | මස්කෙළිය ඔය සහ දිය ඇල |
| බටහිරට | — | මස්කෙළිය ඔයට වැටෙන දිය ඇල. |

2. ගහේවත්ත වත්ත—ප්‍රමාණය අක්. 11, රූඩ් 1, පර්. 14 පමණ—

| | | |
|---|---|---|
| උතුරට | — | මස්කෙළිය ඔය |
| නැගෙනහිරට | — | එම ඉඩමේ ඉතිරි කොටස |
| දකුණට | — | මස්කෙළිය ඔය |
| බටහිරට | — | මස්කෙළිය ඔය. |

11–1222


ලංකාවේ වැලව්වත්තයෙහි පිහිටි "රිස්වර්න් පේපර් මිල්ස් කෝපරේෂන්" හි නිපදවන ලද කඩදාසිවල ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රිතයි.

683——ආර් 10472—1,700 (65/11)